# රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හා රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 02 දරන විදේශ විනිමය (ප්‍රාග්ධන ගනුදෙනුවල යෙදීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9(1) සහ 9(2) වගන්ති ප්‍රකාරව, නියෝගයන්හි දක්වා ඇති සුදුසුකම්ලත් පුද්ගලයින්ට අමතරව පහත සඳහන් පුද්ගලයින්ගේ නමින්ද රාජ්‍ය තාන්ත්‍රික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සහ රාජ්‍ය තාන්ත්‍රික රුපියල් ගිණුම් විවෘත කිරීමට හා පවත්වාගෙන යාමට බලයලත් වෙළෙඳුන් වෙත මෙයින් අවසර දෙනු ලැබේ.

1.1 **සුදුසුකම්ලත් පුද්ගලයින්**

(අ) විදේශීය රාජ්‍ය තාන්ත්‍රික කාර්යාල

(ආ) රාජ්‍ය තාන්ත්‍රික හෝ රාජ්‍ය තාන්ත්‍රික නොවන ගමන් බලපත්‍රයක් සහිත, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් නේවාසික වීසා ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබූ, විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයෙකුගේ ශ්‍රී ලංකාව තුළ සිටින පවුලේ සාමාජිකයන්

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව